සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය / தரம் / Grade: 10 ශ්‍රේණිය	**සිංහල සාහිත්‍ය රසාස්වාදය - I**	කාලය / நேரம் / Time: පැය තුනයි.

නම / பெயர் / Name: ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No.: .....

- අමතර කියවීම් කාලය මිනිත්තු 10යි.

උපදෙස් :

- I පත්‍රය සඳහා පිළිතුරු මෙම පත්‍රයේ ම ලිවිය යුතුයි.
- II පත්‍රය සඳහා පිළිතුරු ලිවීමට උත්තර ලියන කඩදාසි භාවිත කරන්න.
- I පත්‍රය සඳහා ලකුණු 40ක් ද, II පත්‍රය සඳහා ලකුණු 60ක් ද හිමි වේ.

---

1) (i) සිට (v) තෙක් ඇති කොටස් කියවා, ඒවා ඇසුරින් අසා ඇති (අ), (ආ) ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

i. "පුත, ස්ත්‍රීහු නම් නොයෙක් වංචා දනිති"

(අ) මෙහි පුත යන ඇමතුම ලබන්නේ කවුරුන් ද?

.....

(ආ) මේ ප්‍රකාශය කළෝ කවුරුන් ද?

.....

ii. කොතෙක් වෙහෙස ලදුවත් සුදනෝ — පවර
උදක් ලොව සතුන් සිත දුක් කෙරෙති — දුර
පසක් <u>රාහු මුව පත්</u> වෙමිනි බිය — කර
අනික් පසින් ලොව හෙළි කෙරෙය — <u>හිමකර</u>

(අ) ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.

.....

.....

(ආ) මුල් කවි පද දෙකෙහි අර්ථය ලියන්න.

.....

.....

iii. "මල්ලියේ මට වෙසක් කාට් දෙක තුනක් ඇඳල දෙනවද?"

(අ) මෙසේ අසන්නේ කිනම් අයෙකුගෙන් ද?

.....

(ආ) මෙම ප්‍රකාශය උපුටා ගත් නිර්මාණයේ නම කුමක් ද?

.....

Past Papers Wiki

iv. "අයියේ කුඩුව බලන්ට යමු."

(අ) මෙම ප්‍රකාශය උපුටා ගත් කෙටිකතාවේ කතුවරයා කවුද?

.....

(ආ) මෙම ප්‍රකාශය හා සම්බන්ධ අවස්ථාව කුමක් ද?

.....

v. පැයකදි එකට හමුවන දුර ඇත දෙතැන
මෙය වෙන් කරනු හැකි කිසිවෙකු වෙද කොතැන
සුරුට්ටුවට එක් වී උතුරේ ඔතන
බෙදය පිළිස්සී හමු වේවා දකුණ

(අ) මෙම කවිය ඇතුළත් පැදි පෙළේ රචකයා කවරෙක් ද?

.....

(ආ) "බෙදය පිළිස්සී හමුවේවා දකුණ" යන්නෙන් මතු කෙරෙන අර්ථය කුමක් ද?

.....

(ලකුණු 4x5=20යි.)

2) පහත දැක්වෙන ගද්‍ය-පද්‍ය කොටස් දෙකෙන් **එක්** කොටසකට **පමණක්** පිළිතුරු සපයන්න.

කීප දවසකින් ඔක්කාක රජ්ජුරුවන්ගේ සීලවතී දේවිතොමෝ නුවණැති බැවින් කවුරු දනිද්දැයි සිතා රජ්ජුරුවන් වහන්සේ යෙහෙළණියන් දක්නා කැමැත්තම්හයි මදු රජ්ජුරුවන්ට කිවුය. රජ්ජුරුවෝත් මැනවැයි පිළිගෙන දියණියන් කැඳවා යවු ය. එසඳ ප්‍රභාවතී සර්වාභරණයෙන් සැරසී කිරි මවුන් විසින් පිරිවරන ලදුව අවුත් නැන්දණියන් දැකලා සිටියාහ. සීලවතී දේවි ප්‍රභාවතීන් දැක මේ කුමාරිකා යහපත් රූ ඇත්තී ය. මපුතණුවෝ විරූපයහ. ඉදින් මූ උන් දිටුහු නම් එක දවසකුත් නොරඳා පලා යන්නාහ. ඊට නිසි උපායක් කෙරෙමියි සිතා ඉක්බිති බිසව " මහරජ, මාගේ යෙහෙළණියෝ මපුතණුවන්ට නිස්සහ. එතකුදු උවත් අපගේ වංශ පරම්පරාවෙන් පැවත එන චාරිත්‍රයෙක් ඇත. ඉදින් මූ ඒ වූ ලෙස පිළිපදිත් නම් කැඳවාගෙන යම්හයි මදු රජ්ජුරුවන්ට කිවු ය. ඒ අසා මදු රජ්ජුරුවෝ " කවර ආචාරයෙක් දැ " යි විචාළහ. අපගේ වංසයෙහි දරු ගර්භයක් පිහිටන තෙක් ස්ත්‍රීහු දාවල් සාමිපුත්‍රයා දකින්ට නො ලබති. ඉදින් මූ එලෙස පවතිත් නම් කැඳවා ගෙන යම්හ " යි කිවු ය. ඒ අසා රජ්ජුරුවෝ " දියණියෙනි, එලෙස පවතින්ට පිළිවන්දැ' යි විචාළහ. ප්‍රභාවතී 'යහපතැ'යි ගිවිස්සහ. ඉක්බිති ඔක්කාක රජ්ජුරුවෝ මදු රජ්ජුරුවන්ට බොහෝ සම්පත් දී ප්‍රභාවතීන් කැඳවාගෙන ගියහ. මදු රජ්ජුරුවෝත් මහ පෙරහරින් දියණියන් නික්ම වූහ.

ඔක්කාක රජ්ජුරුවෝ ගොස් කුසාවතී නුවර දිව්‍ය පුරයක් මෙන් සරසා බන්ධනගත සියලු සත්ත්වයන් මුදා හරවා පුතණුවන්ට ප්‍රභාවතීන් අග මෙහෙසුන් කොට අභිෂේක කරවා කුස රජ්ජුරුවන්ගේ ආඥාව යයි අණබෙර ලවා සේසත් නැංවූහ.

i. ප්‍රභාවතිය දුටු සීලවතී දේවිය සිතුවේ කුමක් ද?

.....

.....

(ල. 04)

ii. මෙහි සඳහන් උපමාවක් ලියන්න.

.....

(ල. 04)

iii. සීලවතී දේවිය යෙදූ උපාය කුමක් ද?

.....

.....

(ල. 06)

iv. ප්‍රභාවතිය දුටු සීලවතී දේවිය මදු රජ්ජුරුවන්ට කියන්නේ කුමක් ද?

.....

.....

(ල. 06)

නැතහොත්

ගන්තුන තුලානේ අලියා වැටුණු වැ	වේ
සුන්දර හාමි එතරම් පොහොසතෙක් නො	වේ
තුන්ලාභකමබිම වැඩකර දියෙන් වැ	වේ
රන් වන් කරල් බරවී දැන් බිමට නැ	වේ
ඔහුගේ ගමට මා ගිය ඒ පළමු	වර
තවමත් සිතේ ඇත අමතක නො වන	යුර
හේනට ගොසින් ගෙන් හූවක් තරම	දුර
එනවා දිටිමි මිටි බැඳ ගෙන වියලි	දර
දරටික තබා සෙවණැති පලු ගසක	යට
පිස දම දමා දාඩිය එන නළල	පිට
මා එන තුරුම සිට පෙන්වූ සිනහ	කට
තවමත් පෙනේ දුක් දොම්නස් අතර	මට
පෙර දැක නොමැති මුත් සුන්දර හාමි	විසින්
මගෙ තොරතුරු ඇසූ හැටි හිතවතකු	ලෙසින්
ගෙඩියක් කඩාගෙන ගෙම්දුල තැඹිලි	ගසින්
පිළිගැන්වීය මට සොම්නස පිරුණු	ඇසින්
පොල් දෙහි දොඩම් ගස් තුන හතරකි	වත්තේ
දුප්පත්කමයි හැම තැන ලකුණුව	ඇත්තේ
කෙලෙසද කියා කළ ගුණ සැලකිය	යුත්තේ
දුන් සත පනහවත් ඔහු නැත පිළි	ගත්තේ

ආගන්තුකව එන කෙනෙකුට පුරුදු	නැති
හිතවත් කමින් සැලකූ යුතුකමය	සිති
ඔහු වෙත මුදලකින් මා කළ හැටිය	තුති
සිහි වී මගේ කම්මුල රතු පැහැය	ගති

i. මෙම පැදි පෙළට පාදක වී ඇති අත්දැකීම කුමක් ද?

.....

.....

(ල. 04)

ii. සුන්දර හාමිගේ දිවි පෙවෙත කියවෙන කවි පද දෙකක් උපුටා ලියන්න.

.....

.....

(ල. 04)

iii. සුන්දර හාමි ආගන්තුකයාට දැක් වූ සත්කාරය කුමක් ද?

.....

.....

(ල. 06)

iv. කවියා තමන් පිළිබඳව ලැජ්ජාවට පත් වූයේ ඇයි ?

.....

.....

(ල. 06)

Past Papers Wiki

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය / தரம் / Grade: 10 ශ්‍රේණිය	**සිංහල සාහිත්‍ය රසාස්වාදය - II**	කාලය / நேரம் / Time:

නම / பெயர் / Name: ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No: .....

- **පළමුවන** ප්‍රශ්නය ද **2, 3, 4, 5** ප්‍රශ්නවලින් තෝරා ගත් ප්‍රශ්න **දෙකක් ඇතුළුව ප්‍රශ්න තුනකට** පිළිතුරු සපයන්න.

---

1) පහත සඳහන් පැදි පෙළ කියවා, දී ඇති ප්‍රකාශ උපයෝගී කර ගෙන රසාස්වාදයක් ලියන්න.

1. වැහි වලා කුළ, පෑ කළු යැ යි ඔබේ
   නො හොබිති යි කිසි ලෙස් නො සතොස් නො වන්
   සිරුරු පෑයෙනු‘ගත් සුදනෝ ලොවේ
   නො හඳුනත් උතුමන් ගුණයෙන් විනා.

2. පැනැ - නැඟී අහසේ පැතිරී ගොසින්,
   මහ ගිමන් සිඳුවා සත සිත් තොසින්,
   කුඹුරු - වැව් - පොකුණුත් පුරවා දියෙන්,
   ලොවට දෙන්නා ඔබ යි අහරත් පැනුත්.

3. නද අසා ඔබගේ පැහැයත් බලා,
   මොනරු පිල් විදහා රඟ දෙත් නදින්.
   අමුතුයෙන් පණවත් බව ලත් සෙයින්,
   තුරු ලියත් ලිය-ලයි සැනැසී දියෙන්.

4. සුදු වලා කුළු බෝ මැ අහස් කුසේ
   ඉහළ යෙයි; ඔබ යෑම පහත් වැ මැ යි
   එ පුදුමෙක්ද? උසස් නැණවත් දනෝ
   ගුණ බරින් නැමුණෙ’වි පවතිත් නිතින්

5. කටට ගැන්මද බෝ මැ අමාරු වූ
   කර දියත් ඔබ ගත් කලැ සාගරෙන්
   මිහිරි වෙයි උතුමන් සහ වාසයෙන්
   නිවටයෝ ද උසස් වෙති බෝ සෙයින්

PAST PAPERS WIKI

Past Papers Wiki

6. ගුණ බලා ඔබ ගේ ලොසබා දහම්
'ඔබැ'රැ අන් කිසිවෙක් නිසි නෑ' කියා
විදුලියත් පැහැපත් රන දම් සෙයින්
පළඳවන්නෙ ඔබේ ගෙලෙ මැයි බලන්

i. මෙම පැදි පෙළට පාදක වූ අත්දැකීම
ii. පද්‍ය නිර්මාණයේ දී යොදා ගත් කාව්‍යෝක්ති
iii. යොදා ගත් කාව්‍ය භාෂාව හා ආකෘතිය
iv. වැහි වලාකුළෙන් ඇති ප්‍රයෝජන
v. සොබා දහමේ සොඳුරු බව

(ලකුණු 6x5 =30යි)

2) මිනිසුන් තුළ පවත්නා දුබලතා පෙන්වා දී ඒවා නිවැරදි කිරීමට සුභාෂිත කවියා දරා ඇති උත්සාහය නියමිත පද්‍ය තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 15යි)

3) තමා අත්දැකීම රසවත්ව ඉදිරිපත් කිරීමට ජී. බී. සේනානායක දරා ඇති උත්සාහය වෙසක් පහන කෙටිකතාවේ සිද්ධි ඇසුරින් විමසන්න. (ලකුණු 15යි)

4) කුස ජාතකයෙහි සඳහන් සීලවතී බිසව උපායශීලී ප්‍රඥාවන්ත මවකි. සුදුසු නිදසුන් තුනක්වත් ඇසුරින් විමසන්න. (ලකුණු 15යි)

5) තුන්මංහන්දිය නවකතාවේ අපට හමුවන ලොකු මාමා වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ම සැබෑ කලාකරුවෙකි. නිදසුන් තුනක් ඇසුරෙන් විමසන්න. (ලකුණු 15යි)

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi --Sri Lanka's Largest Past Papers Library